
# 10

# විද්‍යාවේ ප්‍රභේද විමර්ශනශීලීව අධ්‍යයනය කරයි.

## පැවරුම්



## *නිපුණතා මට්ටම 10.2*

විද්‍යාවේ ස්වභාවය හා එහි ප්‍රභේද යොදා ගනී.

### පැවරුම්

1. (අ) විද්‍යාවක් අනෙකුත් ශාස්ත්‍රයන්ගෙන් වෙන්කර ගැනීම පිළිබඳ කාල් පොපර්ගේ නිර්ණායකය ලියා දක්වමින් වාදයක් විද්‍යාත්මක එකක් ලෙසින් සැළකීමට තෘප්ත කළයුතු ලක්ෂණ මොනවාදැයි දක්වන්න.

(ආ) පහත සඳහන් විෂයයන් භෞතික විද්‍යා , ජෛවීය විද්‍යා , ව්‍යවහාරික විද්‍යා , සමාජීය විද්‍යා , අනුභූතිමය නොවන විද්‍යා , න' විද්‍යා යන වර්ග අතුරින් කුමකට ගැනේද?

i) තර්ක ශාස්ත්‍රය

ii) ප්‍රලයකර්ම

iii)දේශපාලන අර්ථ ශාස්ත්‍රය

iv)ප්‍රවේණි විද්‍යාව

v)ශක්ති විද්‍යාව

vi)ප්‍රකාශ විද්‍යාව

vii) ජනශ්‍රැති විද්‍යාව

viii) ජාන ඉංජිනේරු විද්‍යාව

ix) කායික විද්‍යාව

x) ශුද්ධ ගණිතය


xi) තාරකා විද්‍යාව

xii) හස්ත රේඛා ශාස්ත්‍රය

xiii) නිර්මිත පරිසරය

xiv) දේව ධර්මය

xv) කෘතිම බුද්ධිය



අන්තර්ගතය සකස් කිරීම : ප්‍රිතිමා සෙනෙවිරත්න මිය, කැ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .
පී. එම්. අමරසේන මයා - මාර / ශාන්ත මරියා කන්‍යාරාමය , මාතර
පරිගණක පිටු සැකසුම : ඕ . පී . එම් . ජී . පී . පී . ඔටුනුපණ්ඩිත මෙය - ශාන්ත මරියා විද්‍යාලය - කෑගල්ල

Copyright © www.e-thaksalawa.moe.gov.lk

2. විද්‍යාත්මක ක්‍රමයක් තුල දැකිය හැකි ලක්ෂණ ලුවී පාශ්චර් හෝ සිම්මෙල්වයිස්ගේ විද්‍යාත්මක ගවේශන ක්‍රියාමාර්ගයන් ඇසුරෙන් කුළුගන්වන්න.

3. ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා අතර ප්‍රභේදය අර්ථාන්විත බවට ඔබ ගෙනෙන තර්ක මොනවාද?

4. සමකාලීන විද්‍යාවන් තුළ ශුද්ධ විද්‍යාව හා ව්‍යවහාර විද්‍යා අතර ප්‍රභේදයකට වඩා සමෝදානික බවක් දැකිය හැකිය. මීට පක්ෂව ගෙනෙන තර්ක මොනවාද?

5. විද්‍යාවන් ඇගයුම්වලින් නිදහස් නමුත් විද්‍යාඥයාට ඇගයුම් වලින් විනිර්මුක්ත විය නොහැක. විමසන්න.

6. "ස්වභාවධර්මය අපට පැහැදිලි කළ හැකි නමුත් සමාජීය හා මානවීය ක්‍රියාවන් පිළිබඳව අපට උපරිම වශයෙන් කළ හැක්කේ තේරුම් ගැනීම පමණි." උක්ත ප්‍රකාශනය සාධාරණීකරණය කරන්නේ කෙසේද?

අන්තර්ගතය සකස් කිරීම : ප්‍රීතිමා සෙනෙවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .
පී. එම්. අමරසේන මයා - මාර / ශාන්ත මරියා කන්‍යාරාමය , මාතර
පරිගණක පිටු සැකසුම : ඕ . පී . එම් . ජී . පී . පී . ඔටුනුපණ්ඩිත මෙය - ශාන්ත මරියා විද්‍යාලය - කෑගල්ල

Copyright © www.e-thaksalawa.moe.gov.lk